// ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 160/60 — 1975 අප්‍රේල් 21 වැනි සඳුද — 1975.04.21

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

### අංක 158 දරණ අත්කර ගැනීමේ ආඥාව

1970 අංක 35 දරණ සමුපකාර සමිති (විශේෂ විධිවිධාන) පනත

10 වෙනි වගන්තිය යටතේ ආඥාව

1970 අංක 35 දරණ සමුපකාර සමිති (විශේෂ විධිවිධාන) පනතේ 10 (1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, විදේශීය හා දේශීය වෙළඳ ඇමති ටිකිරි බණ්ඩා ඉලංගරත්න වන මම, මෙහි වූ උපලේඛනයෙහි නිශ්චිත දේපල, (ලියාපදිංචි කිරීමේ අංක කෑ/384 දරණ) සීමාසහිත රුවන්වැල්ල විවිධ සේවා සමුපකාර සමිතියේ යම් ව්‍යාපාරයක කාර්යයන් සඳහා එකී සමිතිය විසින් ප්‍රයෝජනයට ගත හැකිවනු පිණිස 1975 මැයි මස 07 වැනි දින සිට මෙම ආඥාව මගින් අත්කර ගනිමි.

ටී. බී. ඉලංගරත්න,
විදේශීය හා දේශීය වෙළඳ ඇමති.

1975.4.16 වැනි දින,
කොළඹ දී ය.

#### උපලේඛනය

කෑගල්ල දිස්ත්‍රික්කයේ දෙහිඕවිට ආදායම් පාලක කොට්ඨාශයේ තල්දූව වසම 118 ග්‍රාම සේවක කොට්ඨාශයේ පිහිටියාවූද, මෙහි පහත අයුරු මායිම්වූද ප්‍රමාණයෙන් පර්චස් 20 ක් වූද, අවිස්සාවේල්ලේ තල්දූවේ නිවැසි ඇම්. ඇස්. ඇම්. ෂාපි, ඇම්. ඇස්. ඇම්. කලීජා සහ ඇම්. ඇස්. ඇම්. පාතුම්මා යන අයට අයිති වරිපනම් අංක 964 දරන ගොඩනැගිල්ල ඇතුළු ගොඩවත්ත නමැති කොටස:—

උතුරට: අංක 962 දරන ගොඩනැගිල්ල;
නැගෙනහිරට: අවිස්සාවේල්ල ගිනිගත් හේන පාර;
දකුණට: ගොඩවත්ත ඉඩමේ ඉතිරි කොටස;
බස්නාහිරට: ගොඩවත්ත ඉඩම.

4-546

---

### අංක 159 දරණ අත්කර ගැනීමේ ආඥාව

1970 අංක 35 දරණ සමුපකාර සමිති (විශේෂ විධිවිධාන) පනත

10 වෙනි වගන්තිය යටතේ ආඥාව

1970 අංක 35 දරණ සමුපකාර සමිති (විශේෂ විධිවිධාන) පනතේ 10 (1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, විදේශීය හා දේශීය වෙළඳ ඇමති ටිකිරි බණ්ඩා ඉලංගරත්න වන මම, මෙහි වූ උපලේඛනයෙහි නිශ්චිත දේපල, (ලියාපදිංචි කිරීමේ අංක කෑ/384 දරණ) සීමාසහිත රුවන්වැල්ල විවිධ සේවා සමුපකාර සමිතියේ යම් ව්‍යාපාරයක කාර්යයන් සඳහා එකී සමිතිය විසින් ප්‍රයෝජනයට ගත හැකිවනු පිණිස 1975 මැයි මස 07 වැනි දින සිට මෙම ආඥාව මගින් අත්කර ගනිමි.

ටී. බී. ඉලංගරත්න,
විදේශීය හා දේශීය වෙළඳ ඇමති.

1975.4.16 වැනි දින,
කොළඹ දී ය.

1 A—ඒ 13975—4,315 (75/04)

උපලේඛනය

කෑගල්ල දිස්ත්‍රික්කයේ දෙහිඕවිට ආදායම් පාලක නිලධාරි කොට්ඨාශයේ ගරාගොඩ 115 ඒ ග්‍රාම සේවක කොට්ඨාශයේ පිහිටියාවූද, මෙහි පහත අයුරු මායිම්වූද ගොඩනැගිලි 3 ක් ඇතුළු ප්‍රමාණයෙන් පර්චස් 20 ක් පමණැති බොරලන්කඩ නිවැසි ඇම්. ඒමිස් යන අයට අයිතිවූ මැදවත්ත නොහොත් පහල ගෙදරවත්ත නමැති බිම් කොටස :—

උතුරට : හුඹගහපිටිය වත්ත නොහොත් බබන්ඩියාගේ වත්ත සහ මැදවත්ත නොහොත් පහල ගෙදර වත්තේ ඉතිරි කොටස ;

නැගෙනහිරට : ප්‍රසිද්ධ පාර ;

දකුණට : ප්‍රසිද්ධ පාර සහ මැදවත්ත නොහොත් පහල ගෙදර වත්තේ ඉතිරි කොටස ;

බටහිරට : මැදවත්ත නොහොත් පහල ගෙදර වත්තේ ඉතිරි කොටස.

4-545

---

**අංක 160 දරණ අත්කර ගැනීමේ ආඥාව**

1970 අංක 35 දරණ සමුපකාර සමිති (විශේෂ විධිවිධාන) පනත

**10 වෙනි වගන්තිය යටතේ ආඥාව**

1970 අංක 35 දරණ සමුපකාර සමිති (විශේෂ විධිවිධාන) පනතේ 10 (1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, විදේශීය හා දේශීය වෙළඳ ඇමති ටිකිරි බණ්ඩා ඉලංගරත්න වන මම, මෙහි වූ උපලේඛනයෙහි නිශ්චිත දේපල, (ලියාපදිංචි කිරීමේ අංක කො. 2443 දරණ) සීමාසහිත බත්තරමුල්ල විවිධ සේවා සමුපකාර සමිතියේ යම් ව්‍යාපාරයක කාර්යයන් සඳහා එකී සමිතිය විසින් ප්‍රයෝජනයට ගත හැකිවනු පිණිස 1975 මැයි මස 07 වැනි දින සිට මෙම ආඥාව මගින් අත්කර ගනිමි.

ටී. බී. ඉලංගරත්න,
විදේශීය හා දේශීය වෙළඳ ඇමති.

1975.4.16 වැනි දින,
කොළඹ දී ය.

උපලේඛනය

කොළඹ දිස්ත්‍රික්කයේ හේවාගම් කෝරලය (බටහිර) ආදායම් පාලක නිලධාරි කොට්ඨාශයේ, තලංගම උතුර ග්‍රාම සේවක කොට්ඨාශයේ පිහිටි හෝකන්දර ඩබ්ලිව්. ඒ. පෙරේරා මහතාට අයත් කොස්වත්තේ ලංකා පිරවුම් පොලට යාබද පර්චස් 20 ක් පමණැති ඉඩම සහ ගොඩනැගිල්ල මෙහි පහත සඳහන් මායිම් අනුව අත්කර ගැනීම :—

උතුරට : එම ඉඩමේ කොටසක් ජී. ඩී. ඇම්. අප්පුහාමි හා තව අයට අයිති ඉඩම ;

නැගෙනහිරට : වැලිකඩ අතුරුගිරිය ප්‍රසිද්ධ පාර ;

දකුණට : මාටින් පෙරේරාට අයත් ඉඩම ;

බටහිරට : එම ඉඩමේ කොටසක් ඩබ්ලිව්. ඒ. පෙරේරාට සහ තවත් අයට අයත් ඉඩම.

4-544

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී